# WACE (වෙස්ටර්න් ඔස්ට්‍රේලියානු අධ්‍යාපන සහතික) භාෂා අයදුම්පත් සඳහා සිසු සෝදිසි ලැයිස්තුව

*WACE භාෂා පාඨමාලාවක් සඳහා ඇතුලත්වීමට අවසර ඉල්ලන භාෂා අයදුම්පත්‍රය* සම්පූර්ණ කිරීම ආරම්භ කිරීමට පෙර සිසු සෝදිසි ලැයිස්තුව උපයෝගී කරගෙන සියල්ල සූදානම් කර ගන්න. ඔබට කිසියම් ප්‍රශ්න ඇතිනම්, ඔබගේ මාපියන් හෝ භාරකාරයා, ඔබගේ භාෂා ගුරුවරයා හෝ පාසැල් පරිපාලනයෙන් උපකාර ඉල්ලා සිටින්න, නැතිනම් පාසැල් විෂයමාලා සහ ප්‍රමිති අධිකාරිය (අධිකාරිය) වෙත languagesenrolment@scsa.wa.edu.au ඔස්සේ ඊමේල් පණිවුඩයක් යවන්න. සවිස්තරාත්මක සිසු මාර්ගෝපදේශයක් WACE භාෂා අයදුම්පත්‍ර වෙබ් අඩවිය(https://www.scsa.wa.edu.au/sirs-and-srms-info/srms-information/wace-language-applications). ඔස්සේ ලබාගත හැක.

## 1 සිසු පෝර්ටලය වෙත ලොග්ඉන් වීම

සිසු පෝර්ටලය (https://studentportal.scsa.wa.edu.au) වෙත ලොග් ඉන් වීම සඳහා ඔබගේ පාසැල් ප්‍රගති වාර්තාවේ ඇති **සිසු අංකය** අවශ්‍යවේ. එම අංකය ඔබගේ SmartRider හි ද ඇත. ඔබට **පුද්ගලික ඊමේල් ලිපිනයක්**ද අවශ්‍ය වන අතර ඔබගේ භාෂා අයදුම්පත්‍රය *සම්පූර්ණ කල පසු ඔබගේ පුද්ගලික ඊමේල් ලිපිනය වෙත ප්‍රවේශ වීමට අවශ්‍යවේ*. පුද්ගලික ඊමේල් ලිපිනයක් භාවිතා කිරීම මගින් ඔබ පාසැලෙන් ඉවත්වූ පසු සහ පාසැලේ ඊමේල් ලිපිනයෙහි කාලය ඉකුත්වූ පසු වුවද ඔබට තව දුරටත් ඊමේල් පණිවුඩ ලබා ගැනීමට හැකිවේ.

## 2 අධ්‍යාපන තොරතුරු

පහත සඳහන් අධ්‍යාපන තොරතුරු ඔබ විසින් ලබා දිය යුතුය:

- ❑ පූර්ව-ප්‍රාථමික වසරේ සිට සෑම පාසැල් වසරක් සඳහාම ඔබ සිටි පාසැලේ විස්තර:
  - පාසැලේ නම
  - පාසැලේ ඉගැන්වීමට උපයෝගී කරගත් ප්‍රධාන භාෂාව
  - ඉගෙනගත් භාෂා/භාෂාව (කිසිවක් ඇතිනම්)
  - සතියකට භාෂා අධ්‍යයන පැය ගණන (කිසිවක් ඇතිනම්)
- ❑ ඔස්ට්‍රේලියාවෙන් පිටත පාසැල්වලට ගිය අවස්ථාවල පාසැල් ප්‍රගති වාර්තා (කිසිවක් ඇතිනම්)

## 3 පදිංචිය සම්බන්ධ තොරතුරු

පහත පදිංචි තොරතුරු ඔබ විසින් ලබා දිය යුතුය:

- ❑ ඔබ ජීවත්වූ රටවල්
- ❑ යාමට හේතු සහ එක් එක් රටෙහි සිටි කාලය ඇතුළුව ඔබ ගිය/සංචාරය කල/නිවාඩු ගතකල රටවල් ඔබ ඉගෙනීමට අයදුම් කරන භාෂාව කථාකරන රටවල් පමණක් ඇතුළු කරන්න

## 4 භාෂා පසුබිම

ඔබ විසින් පහත භාෂා තොරතුරු ලබා දිය යුතුය:

- ❑ ඔබ විසින් කථා කිරීමට ඉගෙන ගත් ප්‍රථම භාෂාව/භාෂා
- ❑ ඔබ විසින් කථා කරන, කියවන සහ ලියන වෙනත් භාෂාව/භාෂා
- ❑ ඔබගේ මාපියන් හෝ භාරකරුවන් සහ සහෝදර සහෝදරියන් සහ මිතුරන් සමඟ කථා කරන භාෂාව/භාෂා
- ❑ ඔබගේ මාපියන් හෝ භාරකරුවන් කථා කරන භාෂාව/භාෂා

## 5 උපකාරක ලියකියවිලි

ඔබ විසින් ඔබගේ අයදුම්පත්‍රයට පහත ලියකියවිලිවල ඡායාරූප හෝ ස්කෑන් පිටපත් උඩුගත කල යුතුය:

- ❑ සම්පූර්ණ කල *මාපිය/භාරකාර පිළිගැනීමේ පෝරමය*- අනිවාර්යවේ
- ❑ ඔබ ඉපදුනේ වෙනත් රටක නම් හෝ ඕස්ට්‍රේලියාවෙන් පිටත ජීවත්වූයේ නම්, ගමන් බලපත්‍රයේ හඳුනාගැනීමේ පිටුව
- ❑ ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත පාසැලකට/පාසැල්වලට ගියේ නම් - පාසැල් ප්‍රගති වාර්තා/ව
- ❑ ඔබ අයදුම් කරන භාෂාව කථා කරන රටක ජීවත්වූයේ නම් හෝ නිතර ගමන් කලේ නම්ජා - ත්‍යන්තර ගමන් වාර්තා/ව (අධිකාරිය මගින් ඉල්ලා සිටියේ නම්)

උපකාරක ලියකියවිලි **.pdf**, **.jpg**, **.jpeg** හෝ **.png** ගොනු වශයෙන් ඔබගේ පරිගණකයේ, ජංගම උපාංගයේ **එක් එක් ගොනුවක් උපරිම 4mb වශයෙන් තැන්පත් කර ගන්න**. Word ලියවිලි භාර ගන්**නේ නැති අතර** ගොනු නම් කිරීමේදී < > ? ! / \ " * : , # % $ ( ) { } + = @ වැනි හිස් තැන්, හඳුනා ගත නොහැකි අක්ෂර හෝ සළකුණු භාවිතා නොකල යුතුය.